## Thasthawadaya Paradawa Lebu Jayata Miyanmar Rajya nayakayagen Janapathita Passasum(2009 June 16). Lankadeepa.



2009 ජූනි මස 16 වැනිදා අඟහරුවාදා

ලංකාදීප

5

# ත්‍රස්තවාදය පරදවා ලැබූ ජයට මියන්මාර් රාජ්‍ය නායකයාගෙන් ජනාධිපතිට පැසසුම්

## කොටි ජාවාරම් මඬින්න ලබාදුන් සහයෝගයට ජනපති තුති පුදයි

ත්‍රස්තවාදයට එරෙහි මානුෂික මෙහෙයුම් ඉතා සාර්ථකව නිමා කිරීම පිළිබඳව මියන්මාර රාජ්‍ය නායක තාන් ෂ්වේ මහතා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට ප්‍රසාදය පළ කර ඇත.

දෙදින නිල සංචාරයක් සඳහා මියන්මාරයට ගිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ එරට රාජ්‍ය නායකයා අතර පෙරේදා (14) පැවැති ද්විපාර්ශ්වික හමුවේදී මියන්මාර් රාජ්‍ය නායකයා මෙසේ ප්‍රසාදය පළ කළ බව ජනාධිපති කාර්යාලය නිකුත් කළ නිවේදනයේ සඳහන් වේ.

ජාති ආගම් භේදයකින් තොරව, සියලු දෙනාට ගෞරවයකින් ජීවත්විය හැකි වාතාවරණයක් නිර්මාණය කිරීමට තමාට හැකිවූ බව ජනාධිපති රාජපක්ෂ මහතා එහිදී ප්‍රකාශ කර ඇත.

තිස් වසරක් පැවැති කුරිරු ත්‍රස්තවාදයෙන් අහිංසක ජනතාවගේ ජීවිත ලක්ෂයක් පමණ අහිමිවූ බව ප්‍රකාශ කර ඇති ජනාධිපතිවරයා තමා හමුවේ දැන් ඇති ඉහළම අභියෝගය යුද්ධයෙන් විනාශ වූ ප්‍රදේශ යළි ගොඩනංවා ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම බව පවසා තිබේ.

එල්.ටී.ටී.ඊ. ය විසින් කලාපය තුළ සිදු කරන ලද මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අනෙකුත් නීති විරෝධී ක්‍රියා වැළැක්වීමට මියන්මාර් රජය ලබාදුන් සහයෝගයද ජනාධිපතිවරයාගේ ඇගයීමට ලක්විය.

උතුරේ අවතැන්ව සිටින ජනතාවට අවශ්‍ය සුබසාධන කටයුතු සඳහා ඇමෙරිකානු ඩොලර් 50,000 ක් ලබාදීම පිළිබඳව ද ජනාධිපතිවරයා මියන්මාර් රාජ්‍ය නායකයාට කෘතඥතාව පළ කළේය.

දෙරට අතර පවත්නා රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා සඳහා වසර 60 ක් පිරෙන මෙම අවස්ථාවේ එරට සංචාරය කිරීමට හැකිවීම ගැනද ජනාධිපති රාජපක්ෂ මහතා සතුට පළ කළේය.

2007 වසරේදී දෙරට අතර ඇතිවූ අවබෝධතා ගිවිසුමකට අනුව, සෑම වසරකම මියන්මාර් රජයේ ආරක්ෂක අංශවල නිලධාරීන් දෙදෙනකුට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පුහුණුව ලබාදීමටද මෙහිදී එකඟ විය.

දෙරට අතර ගුවන් සේවා සම්බන්ධතා සඳහා 1950 දී ඇති කරගත් ගිවිසුම වර්තමානයට උචිත පරිදි සකස් කිරීමටද දෙරටේ රාජ්‍ය නායකයෝ එකඟ වූහ.

ලංකාවේ පළාත් 9 ක දාගැබ් 9 ක් ඉදිකිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කරගෙන යන බවට ජනාධිපතිවරයා කළ ප්‍රකාශයට ප්‍රතිචාර වශයෙන් එම දාගැබ් සඳහා කිරිගරුඬ ලබාදීමට ඇති හැකියාව පිළිබඳව සොයා බලන බවට මියන්මාර් රාජ්‍ය නායකයා පොරොන්දු විය.

ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා එන ලෙස ජනාධිපති රාජපක්ෂ මහතා කළ ආරාධනයද මියන්මාර රාජ්‍ය නායකයා පිළිගෙන ඇත.

මේ අතර, ජනාධිපති රාජපක්ෂ මහතා සහ මියන්මාර් අගමැති ජනරාල් තෙයින් සෙන් මහතා අතර හමුවක්ද පෙරේදා පස්වරුවේ පැවැත්විණි.

මෙම හමුවට එරට ඇමැතිවරු පිරිසක්ද එක්ව සිටියහ. මියන්මාර් රජයේ විදේශ ඇමැතිවරයා ළඟදීම මෙරට සංචාරයක් සඳහා පැමිණෙන බවද එහිදී ප්‍රකාශ විය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා දෙරට අතර අවබෝධතා ගිවිසුමක් ද මෙහිදී අත්සන් කෙරිණි.

මියන්මාර් වැසියන්ට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමේදී පහසුවෙන් වීසා ලබාගත හැකි ක්‍රම පිළිබඳව සොයා බැලීමටද මෙහිදී සාකච්ඡාවී ඇත.

දෙදින නිල සංචාරයක් සඳහා මියන්මාරයට ගිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මියන්මාරයේ රාජ්‍ය නායකයා සහ සාමය හා සංවර්ධනය පිළිබඳ කවුන්සිලයේ සභාපති තාන් ෂ්වේ මහතා සමඟ නිල සාකච්ඡා පැවැත්වීම සඳහා ඔහුගේ කාර්යාලයට ගිය අවස්ථාවේදී පිළිගනු ලැබූ අවස්ථාව. (ඡායාරූපය- සුදත් සිල්වා)